බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම
බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ
අංක 204 හි පිහිටි
බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී
2017 දෙසැම්බර් මස 05,06,07,08,11 හා 12 යන දිනවල පෙ.ව. 9.00 ට
"2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය"

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;
(ප්‍ර/ VI (1) / 17 /112)

අ. මීගමුව මහ නගර සභාව මඟින් පාලනය වන සාප්පු සංකීර්ණය අවට මීට අවුරුදු 3 කට පෙර ක්‍රියාත්මක වූ රථවාහන සැලැස්ම විධිමත් ලෙස පැවති බව ඔබතුමා පිළිගන්නේද?

ආ. එකී සැලැස්ම අනුව විශේෂ අවස්ථාවල පමණක් එක් තීරුවක රථ වාහන ගමන් කිරීමට ඉඩ සැලැස්වූ බව ඔබතුමා දන්නෙහිද?

ඇ. මේ වන විට කිසිදු අයකුට නොදන්වා එකී සාප්පු සංකීර්ණයේ එක් පසෙකට පමණක් රථ වාහන ගමන් කිරීමට ඉඩ සලස්වා ඇති බව ඔබතුමා දන්නෙහිද?

ඈ. අදාල ව්‍යාපාරිකයන්ට හා නිලධාරීන්ට නොදන්වා එකී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාල අයට එරෙහිව ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

ඉ. ව්‍යාපාරිකයන්ට සාධාරණය ඉටු කිරීම සඳහා පෙර පරිදි ක්‍රියාත්මක වූ රථ වාහන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා ඔබතුමා ගනු ලබන ක්‍රියාමාර්ගය කුමක්ද?

ඊ. නොඑසේ නම් ඒ මන්ද?

2. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 17 /113)

අ. දීර්ඝ කාලීන බද්දු පදනම මත බප/කැළ/හේකිත්ත ක්‍රිස්තුරාජ විදුහලේ ගොඩනැගිල්ලක් දිස්ත්‍රික් 306බී ජාත්‍යන්තර සිංහ සමාජය වෙත දුන් බව ඔබතුමා පිළිගන්නෙහිද?

ආ. 2014.04.22 දින අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් බව දන්වා වත්තල ප්‍රාදේශීය ලේකම් විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එකී ගොඩනැගිල්ල ප්‍රාදේශීය ලේකම් වෙත පවරා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ඔබතුමා පිළිගන්නෙහිද?

ඇ. පාසලට අත්‍යවශ්‍ය ගොඩනැගිල්ලක් පෞද්ගලික ආයතනයක් වෙත ලබාදීම සම්බන්ධයෙන් අදාළ අයට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

ඈ. නැවත එකී ගොඩනැගිල්ල එම පාසල වෙත ලබාදීම සඳහා ඔබතුමා ක්‍රියාමාර්ගයක් ගන්නේද?

ඉ. නොඑසේ නම් ඒ මන්ද?

3. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 17 /114)

අ. (I) බියගම කොට්ඨාශයේ කඳුබොඩ ආයුර්වේද රෝහලේ මුළු සේවක සංඛ්‍යාව කොපමණද?

(II) එම රෝහලේ ආයුර්වේද වෛද්‍යවරු කීදෙනෙකු සිටීද?

(III) මෙම රෝහලේ නේවාසික ප්‍රතිකාර සඳහා රෝගීන් කී දෙනෙකුට පහසුකම් ඇත්ද?

ආ. (I) මෙම ආයුර්වේද රෝහල සඳහා තිබෙන ගොඩනැගිලි ප්‍රමාණවත්ද?

(II) ප්‍රමාණවත් නොවේනම් ඒ සඳහා ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

(III) වාර්ෂිකව මෙම රෝහල සඳහා කොපමණ මුදලක් නඩත්තු සඳහා වැයවෙයිද?

ඇ. (I) මෙම රෝහලේ සේවක පුරප්පාඩු තිබේද?

(II) ඒ කුමන අංශවලද?

(III) ඒ සඳහා ඔබතුමා ගත් ක්‍රියා මාර්ග මොනවාද?

4. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 17 /115)

අ. කැළණි අධ්‍යාපන කලාපයේ පාසැල් වල වැසිකිළි කැසිකිළි පහසුකම් නොමැති පාසැල් මොනවාද?

ආ. ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග කවරේද?

ඇ. මෙම පාසැල්වල සනීපාරක්ෂක කම්කරුවන් සිටීද?

ඈ. බියගම කොට්ඨාශයේ පාසැල්වල අනධ්‍යයන අංශයේ පුරප්පාඩු තිබේද?

ඉ. එම පුරප්පාඩු තිබෙන්නේ කුමන පාසල් වලටද?

ඊ. බියගම කොට්ඨාශයේ පාසැල් අතරින් භෞතික සම්පත් හා මානව සම්පත් අඩු පාසල් මොනවාද?

උ. ඒ සම්බන්ධව ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද?

ඌ. බියගම කොට්ඨාශයේ යටිහේන ප්‍රාථමික විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2018 වර්ෂයට මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේද?

5. ගරු මංජුල ප්‍රසන්න සම්පත් මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/ VI (1) / 17 /116)

අ. බියගම ප්‍රාදේශීය සභාවේ 2015 මැයි 15 වැනි දායින් පසු මේ දක්වා

I. රියදුරු කී දෙනෙක් බඳවාගෙන ඇත්ද?
II. මාර්ග කම්කරු කී දෙනෙක් බඳවා ගෙන ඇත්ද?
III. සෞඛ්‍ය කම්කරු කී දෙනෙක් බඳවා ගෙන ඇත්ද?
IV. පුස්තකාල සහයකයින් කී දෙනෙක් බඳවා ගෙන ඇත්ද?
V. ආදාහනාගාර ක්‍රියාකරුවන් කී දෙනෙක් බඳවා ගෙන ඇත්ද?
VI. විදුලි කම්කරුවන් කී දෙනෙකු බඳවා ගෙන ඇත්ද?
VII. ඩෙංගු ව්‍යාපෘතිය සඳහා කී දෙනෙකු බඳවා ගෙන ඇත්ද?

ආ.

I. මෙම තනතුරු සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් මොනවාද?
II. මේ සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ දින කවදාද?
III. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට සිටි සාමාජිකයින් කවරහුද?
IV. තවත් පුරප්පාඩු තිබේද?

ඇ.

I. ඩෙංගු මර්දන ව්‍යාපෘතිය සඳහා සේවකයින් කී දෙනෙකු බඳවා ගෙන ඇත්ද?
II. ඒ අය සඳහා වැටුප් ගෙවනු ලැබුවේ කිනම් පදනමකින් ද?

6. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට; (ප්‍ර/ VI (1) / 17 /117)

අ. සීමාසහිත 532/සී වත්තෙගෙදර සණස සමිතියේ මුදල් අක්‍රමිකතාවයට අදාළ විනය පරීක්ෂණ අවසන් වීද?

ආ. අවසන් වී නැතිනම් හේතු කවරේද?

ඇ. මෙතෙක් කළ පරීක්ෂණවලට අනුව සම්පූර්ණ විස්තර ඇතුළත් වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන්නේද?

ඈ. එම වාර්තාව පදනම් කර ගනිමින්, අක්‍රමිකතා සිදු වී ඇති ආකාරය ගැන හෙළි වී ඇති කරුණු මොනවාද?

ඉ. අදාළ සමිතියේ කටයුතු අත්හිටුවීමෙන් පසුව එකතු කරගෙන ඇති මුදල්වල වටිනාකම කීයද?

ඊ. තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින තැන්පත්කරුවන් සඳහා එම මුදල් සාධාරණ ක්‍රමයක්ට බෙදා දීමට කටයුතු කරන්නේද?

උ. නොඑසේ නම් ඒ මන්ද?

7. ගරු සිරිකමල් ගිලීෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/ VI (1) / 17 /118)

අ. i. බස්නාහිර පළාත් සභාවට අයත් ගම්පහ දිස්ත්‍රික්කය තුළ අධ්‍යාපන කලාප ගණන කීයද?

ii. ඒවා මොනවාද?

ආ. i. එම කලාප තුළ සිසුන් 100 අඩු පාසල් කීයක් තිබේද?

ii. ඒවා මොනවාද? අධ්‍යාපන කොට්ඨාශ අනුව සඳහන් කරන්න?

ඇ. මෙම කලාපවල සිසුන් 50 අඩු පාසල් තිබේද? එසේනම් ඒ කුමන කලාපයේ, කුමන කොට්ඨාශවලද? අදාළ පාසල් කුමක්ද?

ඈ. මෙසේ අඩු සිසුන් සංඛ්‍යාවක් සිටීමට හේතුව නිරීක්ෂණය කර තිබේද? එසේ නම් එය සඳහන් කල හැකිද?

ඉ. මෙම තත්ත්වය යහපත් ලෙසට පත් කිරීම සඳහා ඔබ විසින් ලබා දෙන කඩිනම් විසඳුම කුමක්ද?

8. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/ VI (1) / 17 /119)

අ) 2017 වර්ෂ අවසාන ඇගයීම් විභාග සඳහා 6-11 ශ්‍රේණිවල ප්‍රශ්නපත්‍ර සකස් කර මුද්‍රණය කිරීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හරහා සිදුවන බව පිළිගන්නේද?

ආ) මුද්‍රණය කරනු ලබන ප්‍රශ්න පත්‍ර නියමිත පිරිවිතරයන්ට අනුව ජී.එස්.එම් 48 "නිවුස් ප්‍රින්ට්" කඩදාසි භාවිතා කල යුතු බව දන්නේද?

ඇ) සියළුම ශ්‍රේණි සඳහා පොයින්ට් 12 අකුරු වලින් මුද්‍රණය කලයුතු බව දන්නේද?

ඈ) ඒ ඒ ප්‍රශ්න පත්‍ර සඳහා වෙන වෙනම රතු පැහැති තීන්තයෙන් අනුක්‍රමික අංකයක් යෙදිය යුතු බව දන්නේද?

ඉ) ඉහත ආ, ඇ, හා ඈ, හි සඳහන් පිරිවිතරයන්ට අනුව ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කර නැති බව දන්නේද?

ඊ) ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කරන ආයතනය කුමක්ද?

උ) එකී ආයතනයට භාරදී ඇත්තේ කුමන ක්‍රමවේදයකටද?

ඌ) මුද්‍රණ කටයුතු සඳහා ගෙවීම් කර අවසන්ද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. සභාවේ රැස්වීම්

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

"කාර්ය පටිපාටි රීති අංක 08(1) හි කෙසේ සඳහන් වුවද, 2017 දෙසැම්බර් මස 19 වන දිනය සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් විය යුතුය."

IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට;

යෝජනාව :

"2018 වාර්ෂික මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය හා ඒ හා සම්බන්ධ වැඩ කටයුතු සඳහා වෙන් කළ දිනයන්හි වැඩ කටයුතුවලදී කාර්ය පටිපාටි රීති අංක 15(1) හි සඳහන් විධිවිධානයන්ගෙන් කිසිදු බාධාවක් සිදු නොවිය යුතුය."

X . පොදු කටයුතු

ගරු ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) :

"2018 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශය අනුමත කල යුතුය."

## 2017 දෙසැම්බර් මස 05 වන දින පෙ.ව. 9.00 ට

(i) පොදු සාකච්ඡාව
(පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා)
(ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා)

(ii) සභාව කල් තැබීම

## 2017 දෙසැම්බර් මස 06 වන දින පෙ.ව. 9.00 ට

(i) පහත සඳහන් වැය ශීර්ෂයන් පිළිබඳ විවාදය
(පෙ.ව. 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා)

ශීර්ෂ අංක 100 - ආණ්ඩුකාරවරයා
ශීර්ෂ අංක 101 - බස්නාහිර පළාතේ පළාත් සභාව
ශීර්ෂ අංක 102 - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

(ii) ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 104,109,110,111,112
(මධ්‍යාහ්න 12.00 සිට ප.ව.1.00 දක්වා)
(ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා)

(iii) සභාව කල්තැබීම

## 2017 දෙසැම්බර් මස 07 වන දින පෙ.ව. 9.00 ට

(i) ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 104, 109,110,111,112

(පෙ.ව 9.00 සිට පෙ.ව 11.00 දක්වා)

(ii) කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 106, 117, 118, 119, 120

(පෙ.ව 11.00 සිට ප.ව 1.00 දක්වා)

(ප.ව 2.00 සිට ප.ව 5.00 දක්වා)

(iii) සභාව කල් තැබීම

## 2017 දෙසැම්බර් මස 08 වන දින පෙ.ව. 9.00 ට

(i) අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 108, 126

(පෙ.ව 9.00 සිට ප.ව 1.00 දක්වා)

(ප.ව 2.00 සිට ප.ව 3.00 දක්වා)

(ii) මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 107, 121, 122, 123, 124, 125, 103

(ප.ව 3.00 සිට ප.ව 5.00 දක්වා)

(iii) සභාව කල් තැබීම

## 2017 දෙසැම්බර් මස 11 වන දින පෙ.ව. 9.00 ට

(i) මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක : 107,121,122,123,124,125, 103

(පෙ.ව. 9.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා)

(ii) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය.

ශීර්ෂ අංක : 105,113,114,115,116

(මධ්‍යාහ්න12.00 සිට ප.ව. 1.00 දක්වා)

(ප.ව. 2.00 සිට ප.ව. 5.00 දක්වා)

(iii) සභාව කල් තැබීම.

## 2017 දෙසැම්බර් මස 12 වන දින පෙ.ව. 9.00 ට

(i) සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශ වැය ශීර්ෂයන් සම්බන්ධ විවාදය

ශීර්ෂ අංක : 105,113,114,115,116

(පෙ.ව. 9.00 සිට පෙ.ව. 10.00 දක්වා)

(ii) ගරු ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප) :

"2018 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කරන ලද වාර්ෂික මුදල් ප්‍රකාශයට අදාල" විසර්ජන ප්‍රඥප්තිය අනුමත කල යුතුය.

(අදාල ලේඛන පිටපත් ගරු මන්ත්‍රීවරුන් වෙත 2017.11.21 වන දින රැස්වීමේදී බෙදාහැර ඇත.)

(පෙ.ව. 10.00 සිට මධ්‍යාහ්න 12.00 දක්වා)

(iii) සභාව කල්තැබීම

කේ.එච්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2017.11.22 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

# බස්නාහිර පළාතේ පළාත් සභාව
# 2018 වර්ෂයේ මුදල් ප්‍රකාශය පිළිබඳ විවාදය

| ශීර්ෂය | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/කාර්යාලය |
|---|---|
| 100 | ආණ්ඩුකාරවරයා |
| 101 | බස්නාහිර පළාතේ පළාත් සභාව |
| 102 | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 103 | සමූපකාර සේවක කොමිෂන් සභාව |
| 104 | පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය |
| 105 | සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය |
| 106 | කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශය |
| 107 | මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය |
| 108 | අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය |
| 109 | ප්‍රධාන ලේකම් කාර්යාලය |
| 110 | ඉංජිනේරු කාර්යාංශය |
| 111 | ආදායම් දෙපාර්තමේන්තුව |
| 112 | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| 113 | සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව |
| 114 | ආයුර්වේද දෙපාර්තමේන්තුව |
| 115 | සමාජ සේවා දෙපාර්තමේන්තුව |
| 116 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව |
| 117 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 118 | ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 119 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| 120 | සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව |
| 121 | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව |
| 122 | සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව |
| 123 | ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව |
| 124 | නිවාස කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| 125 | කර්මාන්ත දෙපාර්තමේන්තුව |
| 126 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව |